**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (02 කොටස) - 2016**

---

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (02 කොටස) ට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘතියේ කාලය**

---

2015 ජූලි 08 දින පැවති කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයට අනුව, මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කරවීම සහ ක්‍රියාත්මක කිරීම පිළිවෙලින් එවකට මහා මාර්ග, වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග සහ මාර්ග සංවර්ධන සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකිරීමට බලාපොරොත්තු විය. එමනිසා අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කොටස් 04 කට බෙදා තිබුණු අතර ව්‍යාපෘතියේ දෙවන කොටස යටතේ ක්‍රියාත්මක කෙරෙන මීරිගම සිට කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 39.29 ක ඉදිකිරීම් කටයුතු පිළිබඳ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2016 දෙසැම්බර් 29 දිනට ආරම්භ කිරීමට බලාපොරොත්තු වූ අතර 2020 අගෝස්තු 31 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන තිබුණු බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ගිණුම් වාර්තා පිළියෙල කර ඇති බව සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

2016 අයවැය ඇස්තමේන්තුවට අනුව, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 2,943.80 ක ප්‍රතිපාදනයක් සපයා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ඉන් රු.මිලියන 144.30 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**-------------------**

ලැබුණු තොරතුරු වලට අනුව, අධිවේගී මාර්ගයේ දෙවන කොටසේ ඉදිකිරීම් සඳහා 2016 දෙසැම්බර් මස දේශීය කොන්ත්‍රාත්කරුවන් සමඟ කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට භෞතික කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් වාර්තාවී නොතිබුණි.

**3.3 ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාකාරකම්**

**-----------------------------------------**

ලැබුණු තොරතුරුවලට අනුව, රජයට අයත් බිම්කැබලි 4,518 ක් ඇතුළුව ඉඩම් කැබලි 5,231 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කරගැනීමේ සහ නිරවුල් කිරීමේ කටයුතුවල සැලකිය යුතු ප්‍රගතියක් වාර්තාවී නොතිබුණි.